# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 12,156—1960 ජූලි 8 වැනි සිකුරාදා—8.7.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ... | — |
| අග්‍රාණ්ඩුකරාතුමාණන් කරන පත් කිරීම් ... | 753 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ... | 753 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | 753 |
| වෙනත් පත් කිරීම් ... ... ... | 754 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 755 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | 756 |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 757 |
| " සුරාබදු ආඥාපනත " පිළිබඳ දැන්වීම් ... | — |

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1960 අංක 272**

අංකය : ඞී. 33/රෙක් ඩ.

**රාජකීය ලංකා ගුවන් හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

1960 ජූලි මස 1 වැනි දින සිට, තාවකාලික ස්කොඩ්රන් ලීඩර් වශයෙන්—

ප්ලයිට් ලෙප්ට්ටිනන්ට් පත්මන් හරිප්‍රසාධ මෙන්ඩිස් (01029)—ජීඞී/පී.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 ජූනි මස 28 දින,
කොළඹ දීය.

---

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1960 අංක 273**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව පහත සඳහන් පත්කිරීම් කරන ලෙස නියමකර ඇත්තේ ය :—

ඒ. 192/60.

1960 මැයි මස 25 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු සී. ඒ. කුරේ මහතා (සී. සී. ඇස්.) මහා භාණ්ඩාගාරයේ අතිරේක ආයතන පාලක වශයෙන්

ඒ. 197/60.

1960 අප්‍රේල් මස 19 වැනි දින සිට නැවත නියමයක් කරන තුරු ඒ. ආර්. ඇම්. ජයවර්ධන මහතා (සී. සී. ඇස්.) මහා භාණ්ඩාගාරයේ සහකාර සැපයීම සහ සේවක සංඛ්‍යා පාලකයෙකු වශයෙන්

ඒ. 199/60.

1960 මැයි මස 29 වැනි දින සිට 1960 ජූනි මස 10 වැනි දින දක්වා වාරිමාර්ග අධ්‍යක්ෂ ඒ. ඊ. සී. ද ඇස්. ගුණසේකර මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුල හෝ නැවත නියමයක් කරන තුරු වාරිමාර්ග නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්ලිව්. ඒ. ද සිල්වා මහතා වාරිමාර්ග අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

ඒ. 40/60.

1960 මැයි මස 1 වැනි දින සිට උප පොලිස් සුපිරින්ටැන්ඩන්ට් ජේ. වැන්සැන්ඩන් මහතා දෙවෙනි ශ්‍රේණියේ පොලිස් සුපිරින්ටැන්ඩන්ට් වරයෙකු වශයෙන්.

ඊ. ජී. ගුණවර්ධන,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ජූලි මස 4 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. 500, කොළඹ 1.

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

**1960 අංක 274**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේ ය :—

අංකය : ජේඑල්. 6ඒ/48.

බී. ජී. එස්. ඩේවිඩ් මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු ජේ. ජේ. ඩේවිඩ් මහතා 1960 ජූනි 27 වැනි දින සිට මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඑල්. 53ඒ/58.

කේ. ඒ. පී. රණසිංහ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු පී. අසිර්වාතම් මහතා 1960 ජූලි 4 වැනි හා 5 වැනි දිනයන් හි රත්නපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 12ඒ/57.

කේ. සී. ඊ. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එච්. ඩී. රත්නතුංග මහතා 1960 ජූලි 1 වැනි දින සිට 4 වැනි දින දක්වා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ අතිරේක මහේස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : ජේඒ. 12/48.

ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1960 ජූනි 25 වැනි දින සිට, කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 29,702/ඒ, 33,641/ඒ හා 33,885/ඒ නඩුවල තීන්දු දීමට කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 71ඒ/51.

ඩී. විමලරත්න මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු ජේ. එන්. සී. තිරුචෙල්වම් මහතා 1960 ජූනි 27 වැනි දින සිට කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, කොළඹ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 68සී/51.

සී. වී. උදලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. නටරාජා මහතා 1960 ජූනි 25 වැනි දින අනුරාධපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඒ. 40/48.

එස්. ජේ. බී. ධර්මකීර්ති මහතා 1960 ජූලි 11 වැනි දින සිට මාතලේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 6,413 නඩුව ඇහීමට හා තීන්දුව දීමට මහනුවර මාතලේ පිහිටි උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා මාතලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ජේ. අමරසිංහ මහතා 1960 ජූනි 30 දින සිට 1960 ජූලි 7 වැනි දින දක්වා හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සුවාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එච්. ඩී. රත්නතුංග මහතා 1960 ජූලි 1 වැනි හා 2 වැනි දිනයන් හි හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 67සී/58.

ඩබ්ලිව්. ඩී. තාමෝතරම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එස්. ඉලෙයතම්බි මහතා 1960 ජූලි 4 වැනි දින සිට 8 වැනි දින දක්වා යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා යාපනේ මල්ලාකම් පිහිටි උසාවියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : ජේඑල්. 70ඒ/51.

සී. බී. වල්ගම්පාය මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු එෆ්. වී. එච්. ලාබ්‍රොයි මහතා 1960 ජූනි 28 වැනි දින, නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඒ. 56/48.

එම්. එම්. අබ්දුල් කාදර් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඒ. සී. කනගසිංහම් මහතා 1960 ජූලි 1 වැනි දින ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, ත්‍රිකුණාමලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අනුරාධපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය : පීඑල්./වී. 2/50.

ඩී. ඩී. විතාරන මහතා නැති අතර එස්. එස්. එම්. ධීරරත්න මහතා 1960 මැයි 6 වැනි දින මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබොඩ පත්තුවේ කඩවත් සතර හා වැලිගම් කෝරළේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට හා ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවියේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/පී. 6/51.

එස්. ජී. පීරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු ඊ. ගුණසේකර මහතා 1960 ජූනි 28 වැනි දින සිට 1960 ජූලි 2 වැනි දින දක්වා, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට හා වැලිගම් කෝරළේ හා ගඟබොඩ පත්තුවේ අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඒ. 4/53.

එෆ්. ජේ. සී. අබේකෝන් මහතා නැති අතර කේ. පී. ගුණරත්න මහතා 1960 ජූනි 29 වැනි දින කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර හා බස්නාහිර පස්දුන් කෝරළයන් හි හා කළුතර තොටමුනේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ජූනි 29 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායඹිලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

---

# වෙනත් පත් කිරීම්

1960 අංක 275

අංකය : 33/රෙක්ට්

## රාජකීය ලංකා ගුවන් හමුදාව—උසස් කිරීම්

1960 ජූලි මස 1 වැනි දින සිට, ජ්ලයිට් ලෙප්ටිනන්ට් වරුන් වශයෙන්—

ප්ලයිං ඔපිසර් ලින්ඩ්සේ විලියම් අමිර්තරාජා ක්‍රිස්ටියන්—(01049)—ජීඩී/පී.

ප්ලයිං ඔපිසර් නොඑල් ප්‍රැන්සිස් ඉග්නේෂස් ආනන්දප්පා—(01051)—ජීඩී/පී.

ප්ලයිං ඔපිසර් මිල්රෝයි ඇන්තනි ද සොයිසා—(01052)—ජීඩී/පී.

ප්ලයිං ඔපිසර් රොනල්ඩ් ලෙවලින් එඩ්වර්ඩ් පෙරේරා—(01054)—ජීඩී/පී.

ප්ලයිං ඔපිසර් හර්කියුලීස් රාජපක්ෂ—(01060)—ජීඩී/පී.

ප්ලයිං ඔපිසර් ස්ටැන්ලි පීලික්ස් රූපස් ලොයිඩ් පෙරේරා—(01053)—ජීඩී/පී.

ප්ලයිං ඔපිසර් ආන්ඩබුදුගේ වෝල්ටර් ප්‍රනාන්දු—(01050)—ජීඩී/පී.

ප්ලයිං ඔපිසර් මද්දුමකන්කානමලාගේ ඩෙන්සිල් මහානාම පෙරේරා—(01058)—උපකරණ.

ප්ලයිං ඔපිසර් පිට්ස්රෝයි ඔබ්රේ ඔස්ටින් ඊබර්ට්—(01055)—ලේඛක.

ප්ලයිං ඔපිසර් නිස්සංක මානාභරණ එදිරිවීර—(01061)—ලේඛක.

ප්ලයිං ඔපිසර් වෝල්ටර් ජෝෂප් මේ—(01056)—ලේඛක/අධ්‍යාපනික.

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1960 ජූනි මස 28 දින,
කොළඹදීය.

### 1960 අංක 276

අංකය : ඒ. ජේ. 37/5/60.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්, සී. ධම්රත් නම් මහතා කෑගල්ල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චය කරුවකු වශයෙන් පත් කර ඇත්තේ ය.

---

ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 16 වෙනි පරිච්ඡෙදයේ 120 වෙනි වගන්තිය යටතේ ගරු අධිකරණ අමාත්‍යවරයා විසින්—

1960 ජූනි මස 22 වෙනි දින සිට කේ. කේ. එස්. හබිබු මොහමඩු මහතා නැවත වැඩ භාරගන්නාතුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉරිකිලම්පිඩි කොට්ඨාශයේ හදිසි මරණ පරීක්‍ෂක ධුරයෙහි වැඩ බැලීමට කේ. කේ. මාපිල්ලෙයි මරික්කාර් මහතාද,

1960 ජූනි මස 28 වෙනි දින සිට ඒ. කන්දයියා මහතා නැවත වැඩ භාරගන්නාතුරු මඩකලපු දිස්ත්‍රික්කයේ කෝරලෙයි පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරයෙහි වැඩබලන කාලයතුල එම කෝරලේ හදිසි මරණ පරීක්‍ෂක ධුරයෙහි වැඩබැලීමටම ඒ. පෙරුමයිනාර් මහතාද,

1960 ජූනි මස 30 වෙනි දින සිට ආර්. බී. රණතුංග මහතා නැවත වැඩ භාරගන්නාතුරු මඩකලපු දිස්ත්‍රික්කයේ බින්තැන්න පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි ධුරයෙහි වැඩබලන කාලය තුල එම පත්තුවේ හදිසි මරණ පරීක්‍ෂක ධුරයෙහි වැඩබැලීමට ඒ. පෙරුමයිනාර් මහතාද,

1960 ජූනි මස 30 වෙනි දින සිට සථිර පත්කිරීමක් කරණතුරු මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම අඹගමුව කෝරලේ දික්ඔය කොට්ඨාශයේ හදිසි මරණ පරීක්‍ෂක ධුරයෙහි වැඩබැලීමට ජී. තිසේරා මහතාද,

පත් කර ඇත්තේ ය.

ජී. සී. ටී. ඒ. ද සිල්වා,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
සථිර ලේකම්.

1960 ජූලි මස 4 වෙනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දීය.

---

### 1960 අංක 277

1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥපනතේ 12 (1) වැනි වගන්තිය යටතේ, ගරු ස්වදේශ කටයුතු භාර අමාත්‍යතුමා විසින්, ගම්පොල කහටපිටියේ පදිංචි මොහිදීන් මොහමඩ් හලල්දීන් මහතා 1960. 6. 17 දින සිට 1960. 12. 31 වැනි දින වනතුරු මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත, උඩුනුවර, යටිනුවර ආදායම් කොට්ඨාශවල ක්වාසි තනතුරට පත් කර ඇත්තේ ය.

ඇල්. ඇස්. බී. පෙරේරා,
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1960 ජූනි 27 වැනි දින,
කොළඹදීය.

---

## ආණ්ඩුවේ නිවේදන

අ.අකා. අංකය : O.438./56.

ලංකාවෙහි, ස්විට්සර්ලන්තයේ අතී විශෙෂ නියෝජිත හා පූර්ණබල ඇමති ලෙස බලය පවරනු ලැබූ, ආචාර්ය ජැකස් ඇල්බට් කුට්ටාට් උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය මහා රාජිණිය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාර ගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

ඇන්. ඩබ්ලිව්. අතුකෝරාළ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1960 ජූලි 1 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කායභිලයේ දී.

ඇල්.සී.—බී. 207/41.

### 1941 අංක 27 දරන පඩි පාලක සභා ආඥපනත්

#### 6 (2) වන වගන්තිය යටතේ නිවේදනය

මෙයට යා කොට ඇති උපලේඛනයෙහි දැක්වෙන නියෝගය, වෂී 1941 අංක 27 දරන පඩි පාලක සභා ආඥපනතේ වෂී 1943 අංක 40 දරන ආඥපනතින් සංශොධිත 6 (1) වන වගන්තිය යටතේ මවිසින් පනවන ලද බව එකී පඩි පාලක සභා ආඥපනතේ 6 (2) වන වගන්තියේ විධිවිධාන යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ. මේ නියෝගය 1960 අගෝස්තු මස 1 වන දින වලංගු වන්නේ ය.

බී. එච්. අළුවිහාරේ,
කම්කරු, කර්මාන්ත සහ ධීවර කටයුතු
පිළිබඳ ඇමති.

1960 ජූලි 1 වන දින,
කොළඹ දී ය.

## උපලේඛනය

### නියෝගය

වෂී 1941 අංක 27 දරන පඩි පාලක සභා ආඥපනතේ 2 වන කොටසේ විධිවිධාන මෙහි පහත සඳහන් කර්මාන්තයට අදාල විය යුතුය :—

ගුදිරි කොහු සහ ඇටකෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය, එනම්,

(i) නිෂ්පාදනය කරන ලද ගුදිරි කොහු සහ ඇටකෙඳි කොහු ගබඩාවලදී භාර ගැනීම ;

(ii) පිටරට යැවීම පිණිස ගුදිරි කොහු සහ ඇටකෙඳි කොහු සකස් කිරීමේ සහ පැක් කිරීමේ කටයුතු ; සහ

(iii) නැවට ගෙන යාම පිණිස ගුදිරි කොහු සහ ඇටකෙඳි කොහු ප්‍රවහනය කිරීම.

(අ) පහත දැක්වෙන වැඩවල යෙදී සිටින කම්කරුවන්ගේ වැඩද ඊට ඇතුළත් :—

(1) ලොරිවලින් හෝ කරත්තවලින් ගබඩාවට කොහු භාර ගැනීම ;

(2) බැලස් සහ මිටි ගණන් කිරීම ;

(3) බැලස් සහ මිටිවල බර කිරීම ;

(4) කොහු තෝරීම ;

(5) බැලස් සහ මිටි අට්ටි ගැසීම ;

(6) බැලස් සහ මිටි අට්ටි කැඩීම ;

(7) බැලස් සහ මිටි ලිහීම ;

(8) අනවශ්‍ය දේ අස්කිරීම සහ කොහු සුද්ධ කිරීම ;

(9) අවුල් කොහු මිටිකර බැඳීම ;

(10) අවුල් කොහු වේලීම ;

(11) බැලස් සහ මිටි ගබඩාවේ එක් අංශයක සිට තවත් අංශයකට ගෙනයාම ;

(12) ඇටකෙඳි අතින් පීරීම (එනම්, පිටරට යැවීම සඳහා සකස් කිරීම) සහ අත්මිටිවලට බැඳීම ;

(13) පාට කිරීම සඳහා පිළියෙළ කිරීම් වශයෙන් අත්මිටිවලට නොබැඳ අතින් පීරීම (එනම්, පිටරට යැවීම සඳහා සකස් කිරීම) ;

(14) පාට කරන ලද ඇටකෙඳි අතින් පීරීම (එනම්, පිටරට යැවීම සඳහා සකස් කිරීම) සහ අත්මිටිවලට බැඳීම ;

(15) කපන ලද ඇටකෙඳි අත්මිටිවල අස්කොන් කැපීම ;

(16) ඇටකෙඳි බැම් කැපීම ;

(17) බිම තිබෙන කොහු, ප්‍රෙස් තට්ටුවට (එය උසක පිහිටා තිබේ නම්) විසි කිරීම ;

(18) ශුද්ධ කිරීමේ යන්ත්‍රවලට කොහු ඇල්ලීම;

(19) බැලස් පෙට්ටිවල කොහු බැලස් කිරීම ;

(20) කොහු ලනුවලින් කොහු කඹ ඇඹරීම ;

(21) කොහුවලට ගෙන්දගම් දුම දැමීම ;

(22) කොහු පාට කිරීම ;

(23) ඇටකෙඳි අත්මිටි නියමිත දිග ප්‍රමාණවලට කැපීම ;

(24) යාන්ත්‍රික ජම්බාරවලින් හෝ වෙන ක්‍රමවලින් බේල් පෙට්ටිවලට කොහු ඇහිරීම ;

(25) බේල් ප්‍රෙස් යන්ත්‍ර පාලනය කිරීම හා ක්‍රියා කරවීම ;

(26) බේල් මිටි වලයම් පටිවලින් හෝ කඹවලින් වෙලීම ;

(27) බේල් අට්ටි ගැසීම, අට්ටි කැඩීම, උසුලාගෙන යාම, ඉවත් කිරීම, පැටවීම සහ බෑම ;

(28) කොහු ඇඹරීම, සහ සුළි දැමීම;

(29) බැලස් සහ මිටි බේල් ප්‍රෙස් යන්ත්‍රය වෙත ගෙන යාම;

(30) පෙට්ටි කරන්නන් අතට කොහු යැවීම;

(31) ප්‍රෙස් පෙට්ටි වැඩ කිරීම පිණිස වින්චි ක්‍රියා කරවීම;

(32) උණ බම්බු ඉරීම සහ පැලීම;

(33) වලයම් පටි කැපීම;

(34) කොහු කඹ දඟ ඇරීම;

(35) කොහු පැක් කිරීමේදී සහ සකස් කිරීමේදී පාවිච්චි වෙන සුළු සුළු භාණ්ඩ භාර ගැනීම, ගණන් කිරීම, බර කිරීම, අඩුක් කිරීම, ඉවතට ගෙනයාම, කැපීම සහ පිළියෙල කිරීම;

(36) ප්‍රෙස් යන්ත්‍රය, තට්ටුව, වල සහ වටාපිටාව පිස දැමීම සහ සුද්ධ කිරීම;

(37) බේල් මිටි ගෝනිවලින් වසා මැසීම;

(38) කරදාසිවලින් හෝ ගෝනිවලින් බැලස් එතීම;

(39) නැවට පැටවීමට බඩු මිටි ලකුණු කිරීම;

(40) නැවට පැටවීමට බඩු මිටි ඉවත් කිරීම;

(41) කෑම සහ තේ පිළියෙල කිරීම හා බෙදීම;

(42) කංකානම් කෙනකුගේ වැඩ;

(43) පීරීම සඳහා තෙල් දීම;

(44) ගබඩා සහ කානු පිස දැමීම;

(45) ඉවත දැමීම සඳහා කොහු බත් සහ කුණු රොඩු අහක් කිරීම;

(46) කොහුබත් හැලීම;

(47) කොහුබත් සහ කුණු රොඩු ගෝනි කිරීම; සහ

(ආ) පහත දැක්වෙන කම්කරුවන්ගේ වැඩ හැර (අ) ඡේදයේ දක්වන ලද වැඩකටයුතුවලට සම්බන්ධ වූ හෝ අනියම් වූ හෝ වෙනත් වැඩ වේනම් ඒවා:—

(1) ලිපිකරුවෝ, ගබඩාකරුවෝ, වේලා සටහන්කරුවෝ, හරි වැරදි බලන්නෝ, ඕවර්සියර්වරු සහ මුරකරුවෝ;

(2) වර්ෂ 1945 නොවැම්බර් මස 2 වන දින අංක 9,481 දරන ගැසට් පත්‍රයේ පළවූ නියෝගයෙහි නියමිත මෝටර් රථ ගමනා ගමන කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවෝ;

(3) වර්ෂ 1949 දෙසැම්බර් මස 16 වන දින අංක 10,054 දරන ගැසට් පත්‍රයේ පළ වූ සහ අනතුරුව සංශෝධනය කරන ලද පරිද්දෙන් ගතයුතු නියෝගයෙහි නියමිත ගොඩනැගිලි කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවෝ; සහ

(4) වර්ෂ 1944 ජනවාරි මස 7 වන දින අංක 9,224 දරන ගැසට් පත්‍රයේ පළ වූ සහ අනතුරුව සංශෝධනය කරන ලද පරිද්දෙන් ගතයුතු නියෝගයෙහි නියමිත ඉංජිනේරු කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවෝ.

---

## පඩි පාලක සභා ආඥාපනත

වර්ෂ 1953 අංක 5 දරන පඩි පාලක සභා (සංශෝධන) පනතින් හා වර්ෂ 1943 අංක 40 දරන පඩි පාලක සභා (සංශෝධන) ආඥාපනතින් සංශෝධිත වර්ෂ 1941 අංක 27 දරන පඩි පාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ කම්කරු, කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ඇමතිතුමන් විසින් පහත සඳහන් පත්කිරීම් කරන ලද බව වර්ෂ 1943 පඩි පාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදන කරනු ලැබේ:—

(i) කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ සාමාජිකයකුව සිට ඉල්ලා අස්වූ සී. වේලාරත්න මහතා වෙනුවට එම පඩි පාලක සභාවේ නම නියම කොට පත් කළ සාමාජිකයකු වශයෙන් පෙනී සිටීමට සිල්වියා ප්‍රනාන්දු නෝනා මහත්මිය;

(ii) ඉහත සඳහන් ආඥාපනතේ 12 (2) වන වගන්තියේ නියමයන් යටතේ කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස් වූ ලෙස සැලකෙන එච්. ඩී. අබේගුණවර්ධන මහතා වෙනුවට එම පඩි පාලක සභාවේ සේව්‍ය නියෝජිත සාමාජිකයකු වශයෙන් පෙනී සිටීමට කේ. ජී. සී. අබයසූරිය මහතා;

(iii) ඉහත සඳහන් ආඥාපනතේ 12 (2) වන වගන්තියේ නියමයන් යටතේ කුරුඳු කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වූ ලෙස සැලකෙන දොස්තර ඩබ්ලිව්. ඩී. ද සිල්වා මහතා වෙනුවට එම පඩි පාලක සභාවේ සේවක නියෝජිත සාමාජිකයකු වශයෙන් පෙනී සිටීමට එච්. සී. වෙඩිවර්දන මහතා.

සී. බී. කුමාරසිංහ,
වැ. බ. ස්ථිර ලේකම්වරයා,
කම්කරු, කර්මාන්ත හා ධීවර කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය.

1960 ජූලි මස 1 වැනි දින,
කොළඹ දී ය,

---

## පඩි පාලක සභා ආඥාපනත

වර්ෂ 1959 දෙසැම්බර් 13 වන දින සිට අවුරුදු 3ක කාලයක් තුළ බීඩී කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ සාමාජිකයන් හැටියට පෙනී සිටීමට වර්ෂ 1941 අංක 27 දරණ පඩි පාලක සභා ආඥාපනතේ 9 වන වගන්තිය යටතේ ගරු කම්කරු, කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ඇමති තුමන් විසින් මෙහි පහත සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩි පාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සී. බී. කුමාරසිංහ,
වැ. බ. ස්ථිර ලේකම්වරයා,
කම්කරු, කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ
අමාත්‍යාංශය.

1960 ජූලි 1 වැනි දින,
කොළඹ දී ය.

**නම නියම කොට පත්කරන ලද සාමාජිකයෝ—**

| | | |
|---|---|---|
| 1. | ඇස්. ඒ. විජයතිලක | මහතා |
| 2. | ඇස්. බී. යටවර | ,, |
| 3. | සිල්වියා ප්‍රනාන්දු | මහත්මිය |

**සේව්‍ය නියෝජිතවරු—**

| | | |
|---|---|---|
| 1. | ටී. නීතිරාජා | මහතා |
| 2. | ඇම්. එච්. පියසේන | ,, |
| 3. | සරත් පී. කරුණානායක | ,, |
| 4. | ඊ. ඩී. සේදිරිස් | ,, |
| 5. | ඇන්. සකලසූරිය | ,, |
| 6. | ඇම්. පී. සයිමන් | ,, |

**සේවක නියෝජිතවරු—**

| | | |
|---|---|---|
| 1. | ඇන්. ෂන්මුගනාසන් | මහතා |
| 2. | සිසිල් ද සිල්වා | ,, |
| 3. | කේ. ඇම්. අන්වර්ෂා | ,, |
| 4. | ඇස්. පී. ඇන්තනි | ,, |
| 5. | ඇම්. බී. වික්‍රමසිංහ | ,, |
| 6. | එච්. ඒ. ජයතුංග | ,, |

---

# මිල පාලන දැන්වීම්

**අංක වී 62 දරන මිල නියෝගය** **වී**

## 1950 අංක 29 දරන මිල නියෝගය

වවුනියා දිස්ත්‍රික්කයේ සහකාර මිල (ආහාර) පාලක නැන්පත් පරමනාදන් වෙල්වරත්නම් වන මම, 1950 අංක 29 දරන මිල පාලන පනතේ 3 (2) වන ඡේදය සමග කියයුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව මෙම නියෝගයෙන්—

(1) 1958 මැයි 30 වෙනි දින අංක 11,327 දරන ආණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1958 මැයි 26 දින අංක වී. 46 දරන වී සම්බන්ධ මිල පනත අද සිට අවලංගු කරමි.

(2) මෙහි පළමුවන ලේඛනයේ දෙවෙනි තීරයේ නියම කර තිබෙන මිළ ගණන් තොග වශයෙන් සේරු 96ක් විකිණිය හැකි වැඩිම තොග මිළ ගණන් වලට වැඩියෙන් එම ලේඛනයේ පළමු වෙනි තීරයේ සඳහන් පෙදෙස්වල නොවිකිණිය යුතුයි.

(3) පළමුවන ලේඛනයේ 3 වෙනි තීරයේ සඳහන් මිළ ගණන් සිල්ලර වශයෙන් වී සේරුවක් විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ ගණන් වලට එම ලේඛනයේ පළමුවන තීරයේ සඳහන් පෙදෙස්වල වී මිළ වැඩි නොවිය යුතුයි.

(4) තවද මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) විකුණනු ලබන වී ප්‍රමාණයක් නැවත විකුණනු සඳහා විකිණීම තොග වශයෙන් විකිණීම ලෙස ගණන් ගන්නා බවත්;

(ආ) විකුණනු ලබන වී ප්‍රමාණය පරිභෝගය සඳහා හෝ පාවිච්චිය සඳහා ගනු ලබන්නේ නම් එය සිල්ලරට විකිණීම ලෙස ගණන් ගන්නා බවත් මෙයින් දන්වමි,

(5) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරන ලද පෙදෙස්වල යම් තැනක යම් වෙළෙන්දෙකු ළඟ වී ඇත් නම්, ඔහු විසින් මෙම නියෝගයේ නියමිත වැඩිම මිළ ගණන් ප්‍රසිද්ධ ලෙස ප්‍රදර්ශනය කෙරෙන නිවේදනයක් එකී ස්ථානයේ තැබිය යුතු බව මෙයින් දනුම් දෙමි.

(6) මෙම නියෝගයේ සඳහන් පෙදෙස්වල වී තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් හෝ විකුණන සෑම කෙනෙකු විසින්ම මිළ දී ගන්නා ඉල්ලුම් කළ හොත් පහත සඳහන් විස්තර ඇතුලත් කුවිතාන්සියක් දිය යුතුයි :—.

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ වී ප්‍රමාණය ;
(ඇ) විකුණූ වී වලට ගෙවූ මුදල ; සහ
(ඈ) විකිණීම තොග වශයෙන්ද සිල්ලර වශයෙන්ද යන වග.

1960 ජූනි මස 29 වෙනි දින පෙරවරු 11ට වවුනියාවේ කච්චේරියේදී අත්සන් කරන ලදී.

පී. වෙල්වරත්නම්,
වවුනියා දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලකතැන.

## පළමුවෙනි ලේඛනය

| අංක | පළමුවෙනි තීරය<br>විස්තර | දෙවෙනි තීරය<br>සේරු 96 ක් විකිණිය හැකි වැඩිම තොග මිළ<br>රු. ශ. | තුන්වෙනි තීරය<br>සේරුවක් විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ<br>රු. ශ. |
|---|---|---|---|
| 1. | වවුනියා දකුණු දෙමළ කොට්ඨාශයේ— | | |
| | (අ) වවුනියා සහ නෙලුන්කුලම් ගම් මුලාදෑනි කොට්ඨාශ ... | 13 1 ... | 0 14 |
| | (ආ) අන්දියපුලියන්කුලම් | | |
| | පූදුවෙන්තපුලවු | | |
| | මුදලියාකුලම් ... | | |
| | වෙඩ්ඩේකුලම් | 13 1 ... | 0 14½ |
| | පූදුකුලම් ... | | |
| | රාසේද්‍රකුලම් ... | | |
| | ඔමන්තෙයි ... | | |
| 2. | වවුනියා දකුණු සිංහල කොට්ඨාශයේ— | | |
| | (අ) මඩුකන්ද සහ ඉරට්පෙරියකුලම ගම්මුලාදෑනි කොට්ඨාශ — | 13 1 ... | 0 14 |
| | (ආ) උලුක්කුලම සහ මාමඩුව ... | 13 1 ... | 0 14½ |
| 3. | මුහුදුබඩ කොට්ඨාශයේ— | | |
| | (අ) මුලතිවු සහ තන්නියුත්තු ගම් මුලාදෑනි කොට්ඨාශ ... | 13 86 ... | 0 15 |
| | (ආ) මුල්ලියාවලෙයි ... ... | 13 86 ... | 0 15½ |
| 4. | වවුනියා උතුරු කොට්ඨාශයේ— | | |
| | තන්ඩවාන් ... | | |
| | නෙඩුන්කර්නි ... | | |
| | පරන්තන් ... | | |
| | කච්චිලාමඩු ... | 14 10 ... | 0 15½ |
| | මාන්කුලම් ... | | |
| | පූලියන්කුලම් ... | | |
| | කනගරායකුලම් ... | | |

සැලකිය යුතුයි.—මෙම මිළ ගණන් ඒවා විකිණිය යුතුයයි නියමිත මිළ නොවේ. එම ගණන් බඩු විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය.

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## 1946යේ අංක 32 දරණ වාරි මාර්ග ආඥාපනත

රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති තැන්පත් ලයනල් බාක්‍රොෆ්ට් අබයරත්න මහතා විසින් 1946යේ අංක 32 දරණ වාරි මාර්ග ආඥාපනතේ අංක 113 දරණ වගන්තියේ ප්‍රකාර මා වෙත පවරා ඇති බල තල අනුව, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන්පත් බී. සී. ආර්. ජයසිංහ වන මම, යටකී වාරි මාර්ග ආඥාපනතේ අංක 15 (ඒ) දරණ වගන්තියේ ප්‍රකාර පහත දැක්වෙන උප ලේඛනයෙහි සඳහන් යෝජනාව අනුමත කරමි.

බී. සී. ආර්. ජයසිංහ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන,
රත්නපුර දිස්ත්‍රික්කය.

ගොවිජන සේවා කාර්යාලය,
බටුගෙදර, රත්නපුර,
1960.6.30.

### උප ලේඛනය

"1946 යේ අංක 32 දරණ වාරි මාර්ග ආඥාපනතේ 5 වන කොටස යටතේ සකස් කරනු ලැබූ, රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ මැද පත්තුවේ කරවිට පිහිටි අරබේබොඩ යෝජිත අමුණ තැනීම, එකී සුළු වාරි කර්මාන්තයෙන් ප්‍රයෝජනය ලැබිය හැකි කුඹුරු පිහිටි ප්‍රදේශයේ පදිංචි කුඹුරු හිමියෝ වන අපි, අපගේ මෙම රැස්වීමේදී යටකී කරවිට පිහිටි අරබ්බොඩ අමුණ තැනීම අනුමත කරන අතරම, එකී අමුණෙන් වැඩ කළ හැකි සියලුම කුඹුරු, රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති තුමන්ගේ සතුටට හේතුවන අයුරු වැඩ කිරිමට ද, එකඟ වෙමු".

---

### දැන්වීමයි

මොණරාගල දිස්ත්‍රික්කයේ තිබෙන පහත සඳහන් තානායම් 1960 ජූලි මස 18 වන දින සිට 1960 ජූලි මස 21 වන දින දක්වා මහ ජනයාගේ ප්‍රයෝජනය සඳහා විවෘතව තබනු නොලැබේ :—

1. මොණරාගල තානායම.
2. වැල්ලවාය තානායම.
3. තණමල්විල තානායම.
4. බිබිල තානායම.

ඇල්. ඇන්. ද ඇල්. බණ්ඩාරනායක,
මොණරාගල දිස්ත්‍රික්කයේ වැඩබලන
දිසාපති තැන.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රණය කරන ලදී.